රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: **(94) 011- 2694560** Telephone
ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** Fax
ඊ-මේල් / மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: **www.pubad.gov.lk** Web Site

මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/පොදු
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.05.12

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීම</u>**

2013 වර්ෂයේ සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත්කරන ලද නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ 12.1.1 ඡේදය අනුව සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට උසස් කිරීමේ අවම සේවා කාලය 2023 වර්ෂය වන විට සම්පූර්ණ කරනු ලබයි.

02. ඒ අනුව 2013 වසරේදී සංවර්ධන නිලධාරී සේවයට බඳවාගනු ලැබූ නිලධාරීන් සංඛ්‍යාව සංඛ්‍යාත්මකව ඉහළ අගයක් වන බැවින් මෙම උසස්වීම් ලබා දීමේ කටයුතු අවම පිරිවැයක් සහිතව වඩා කාර්යක්ෂම හා සඵලදායී ලෙස සිදු කරනු වස් ඒකාබද්ධ සේවයේ නිලධාරීන් සඳහා වන තොරතුරු කළමනාකරණ පද්ධතිය (MISCO) හරහා මාර්ගගත ක්‍රමයට අයදුම්පත් කැඳවීම සඳහා වන මෘදුකාංගයක් හඳුන්වාදීමට නියමිතය. එම මෘදුකාංගය සකස් කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතින අතර එම කටයුතු අවසන් වන තෙක් 2023 පෙබරවාරි, මාර්තු, අප්‍රේල් හා මැයි මාසවල සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට උසස්වීම් ලැබීමට අවම සේවා කාලය සම්පූර්ණ කරනු ලබන නිලධාරීන්ට තම අයදුම්පත ඉදිරිපත් කිරීම සඳහා මේ සමඟ අමුණා ඇති අයදුම්පත්‍ර ආකෘතිය භාවිතා කළ හැකිය.

03. ඉහත කී මෘදුකාංගය හඳුන්වාදුන් වහාම මෙම ආකෘතියෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර භාරගනු නොලබන අතර එකී ආකෘතිය ප්‍රකාරව දෘඪ පිටපත් ලෙස ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනය පිළිබඳව මෘදුකාංගය හඳුන්වා දීමේදී ඔබ දැනුවත් කරන බවද කාරුණිකව දන්වමි. සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට උසස්වීම් සඳහා සංවර්ධන නිලධාරීන් අදාළ ලිපිලේඛන එවීමේදී විවිධ වූ ආකෘති පත්‍ර භාවිත කිරීමෙන් හා අවශ්‍ය ලිපිලේඛන නිසි පරිදි නොලැබීම නිසා උසස්වීම් කටයුතු සිදුකිරීමේදී අනවශ්‍ය ප්‍රමාදවීම් සිදුවිය හැකි බව දන්වන අතර මේ සමඟ හඳුන්වා දෙනු ලබන ආකෘතිය පමණක් භාවිතා කොට තම අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලෙස ද දන්වමි.

04. ඒ අනුව 2023 පෙබරවාරි, මාර්තු, අප්‍රේල් හා මැයි මාසවල උසස් කිරීමට සුදුසුකම් ලබන නිලධාරීන් විසින් මේ සමඟ හඳුන්වා දෙනු ලබන අකෘතිපත්‍රය භාවිතා කර ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර පමණක් පහත ලේඛනවල සහතික කරන ලද පිටපත් සමඟ අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානී/ ආයතන ප්‍රධානීගේ නිර්දේශ සහිතව මා වෙත යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

- **i.** යාවත්කාලීන කරන ලද වර්යා සටහන
- **ii.** අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කර ඇති බවට/ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කල බවට ආයතන ප්‍රධානී විසින් නිලධාරියා වෙත නිකුත් කර ඇති ලිපිය හා ප්‍රතිඵල ලේඛන/ සහතිකපත්

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

ඇමුණුම 01

# සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන් සාමාන්‍ය කාර්යය සාධනය මත II ශ්‍රේණියට උසස්කිරීම සඳහා වූ අයදුම්පත්‍රය

## I කොටස - නිලධරයාගේ ඉල්ලීම

| | | |
|---|---|---|
| **01** | **පෞද්ගලික තොරතුරු** | |
| i | නිලධාරියාගේ සම්පූර්ණ නම | |
| ii | මුලකුරු සමඟ නම | |
| iii | පත්වීම් අංකය | |
| iv | ජාතික හැඳුනුම්පත් අංකය | |
| v | දුරකථන අංකය | |
| **02** | **සේවා කාලය පිළිබඳ තොරතුරු** | |
| i | වර්තමාන සේවා ස්ථානය | |
| ii | මුල් පත්වීම් දිනය | |
| iii | සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියේ වසර දහයක (10) සක්‍රිය හා සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කළ දිනය | |
| | **................................. දින සිට සංවර්ධන නිලධාරී සේවයේ II වන ශ්‍රේණියට උසස් කරන මෙන් ඉල්ලා සිටිමි.** | |
| | දිනය : ...................................... | අයදුම්කරුගේ අත්සන : ......................... |

## II කොටස - දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| i | සංවර්ධන නිලධාරී සේවයේ III ශ්‍රේණියේ වසර දහයක (10) සක්‍රීය හා සතුටුදායකසේවා සේවා කාලය සම්පූර්ණ කරන දිනය | | .................................................... | | | |
| ii | III ශ්‍රේණියට නියමිත වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන තිබේද (ඔව්/නැත) | | .................................................... | | | |
| iii | අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබේද (ඔව්/නැත) | | .................................................... | | | |
| iv | අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කළ දිනය | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව | පරීක්ෂණය | දිනය | ඇමුණුම් අංකය | |
| | | | ලිඛිත | | | |
| | | | වාචික | | | |
| | | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව | දිනය | | ඇමුණුම් අංකය | |
| | | | පැය ගණන | | | |
| v | නිලධාරියා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 යටතේ වැටුප් රහිත විදේශීය නිවාඩු ලබා ගෙන තිබේද (ඔව්/නැත) | | .................................................... | | | |
| | ඉහත පිළිතුර ඔව් නම් | වැටුප් රහිත කාලය | කාලසීමාව | අවු. | මාස | දින |
| | | | ..........................දින සිට<br>.....................දින දක්වා | | | |
| | | මාසිකව ඇ.ඩො. 200ක් හෝ විදේශ රැකියාවෙන් ලැබෙන වැටුපෙන් 25%ක් හෝ මෙරටට ප්‍රේෂණය කර තිබේද | .................................................... | | | |
| vi | නිලධාරියා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 (ii) යටතේ වැටුප් රහිත දේශීය නිවාඩු ලබා ගෙන තිබේද (ඔව්/නැත) | | .................................................... | | | |
| | ඉහත පිළිතුර ඔව් නම් | වැටුප් රහිත කාලය | කාලසීමාව | අවු | මාස | දින |
| | | | ..........................දින සිට<br>.....................දින දක්වා | | | |
| | | වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලෙහි දායක මුදල් ප්‍රේෂණය කර තිබේද | .................................................... | | | |

<table>
<tr><td rowspan="3">vii</td><td colspan="2">vහි විධිවිධාන වලින් පරිබාහාරව නිලධාරියා වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ගෙන තිබේද (ඔව්/නැත)</td><td colspan="4">....................................................</td></tr>
<tr><td colspan="2" rowspan="2">ඉහත පිළිතුර ඔව් නම්</td><td>කාලසීමාව</td><td>අවු.</td><td>මාස</td><td>දින</td></tr>
<tr><td>..........................දින සිට<br>.....................දින දක්වා</td><td></td><td></td><td></td></tr>
</table>

<table>
<tr><td rowspan="3">viii</td><td colspan="2">නිලධාරියා තාවකාලිකව රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සේවයෙන් පරිබාහිර තනතුරු සඳහා මුදා හැර තිබේද (ඔව්/නැත)</td><td colspan="5">....................................................</td></tr>
<tr><td rowspan="2">ඉහත පිළිතුර ඔව් නම්,</td><td>මුදාහරින ලද තනතුර</td><td>කාලසීමාව</td><td>අවු</td><td>මාස</td><td>දින</td><td>ස්වභාවය</td></tr>
<tr><td></td><td>..........................දින සිට<br>.....................දින දක්වා</td><td></td><td></td><td></td><td>නිලධාරියාගේ ඉල්ලීමක්/රජයේ අවශ්‍යතාවයක්</td></tr>
</table>

<table>
<tr><td rowspan="3">ix</td><td colspan="2">නිලධාරියා ඉහත v,vi,vii හා viii යටතට නොගැනෙන වෙනත් වැටුප් රහිත හෝ සහ අඩ වැටුප් සහිත නිවාඩු (ප්‍රසූත නිවාඩු හැර) ලබා තිබේද (ඔව්/නැත)</td><td>....................................................</td></tr>
<tr><td rowspan="2">ඉහත පිළිතුර ඔව් නම්,</td><td>අඩවැටුප් දින ගණන</td><td>....................................................</td></tr>
<tr><td>වැටුප් රහිත දින ගණන</td><td>....................................................</td></tr>
<tr><td rowspan="5">x</td><td colspan="2">සේවා කාලය තුළ විනය දඬුවමකට (අවවාද කිරීමක් හැර) යටත් කර තිබේද (ඔව්/නැත)</td><td>....................................................</td></tr>
<tr><td rowspan="4">ඉහත පිළිතුර ඔව් නම්, එම දඬුවම</td><td>වරදේ ස්වභාවය</td><td></td></tr>
<tr><td>ආ.සං. XLVIII වන පරිච්ඡේදයේ වැරදි පිළිබඳ පළමුවන උපලේඛනය යටතේ දක්වා ඇති වරදක් වන සම්බන්ධයෙන් වන දඬුවමකි</td><td></td></tr>
<tr><td>ආ.සං. XLVIII වන පරිච්ඡේදයේ වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දක්වා ඇති ඇති වරදක් වන සම්බන්ධයෙන් වන දඬුවමකි</td><td></td></tr>
<tr><td>ආ.සං. XLVIII වන පරිච්ඡේදයේ 25.2 වගන්තිය යටතේ දක්වා ඇති ලඝු විනය ක්‍රියාපටිපාටිය යටතේ විනය දඬුවමකි</td><td></td></tr>
<tr><td rowspan="2">xi</td><td colspan="2">නිලධාරියාට විරුද්ධව විනය ක්‍රියාමාර්ග/අධිකරණ ක්‍රියාමාර්ග ආරම්භ කර තිබේද (ඔව්/නැත)</td><td>....................................................</td></tr>
<tr><td colspan="2">නිලධාරියාට විරුද්ධව ඉදිරියේදී විනය ක්‍රියාමාර්ග/අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට දැනට අදහස් කර තිබේද (ඔව්/නැත)</td><td>....................................................</td></tr>
<tr><td rowspan="3">xii</td><td colspan="2">නිලධාරියාට සේවා කාලය තුළ සේවය හැර යාමේ නිවේදන නිකුත් කර තිබේද (ඔව්/නැත)</td><td>....................................................</td></tr>
<tr><td rowspan="2">ඉහත පිළිතුර ඔව් නම්,</td><td>නිලධාරියා නැවත සේවය පිහිටුවීමේ ලිපියක් නිකුත් කර තිබේද (ඔව්/නැත)</td><td>....................................................</td></tr>
<tr><td>ඒ අනුව නිලධාරියා රාජකාරී භාරගත් දිනය</td><td>....................................................</td></tr>
<tr><td rowspan="2">xiii</td><td colspan="2">නිලධාරියා ඉල්ලා අස්වීමකින් හෝ ස්ථිර වශයෙන් රාජ්‍ය සේවයෙන් මුදාහැරීමෙන් පසු නැවත සේවයේ පිහිටුවීමක් සිදුකර තිබේද (ඔව්/නැත)</td><td>....................................................</td></tr>
<tr><td colspan="2">ඉහත පිළිතුර ඔව් නම්, ඒ අනුව නිලධාරියා රාජකාරී භාරගත් දිනය</td><td>....................................................</td></tr>
</table>

<table>
<tr><td>xiv</td><td>යාවත්කාලීන කරන ලද චර්යා සටහන</td><td>අමුණා ඇත</td><td></td><td>අමුණා නැත</td><td></td></tr>
</table>

**මෙම නිලධාරියා /නිලධාරිනිය .......................... දින සිට සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට උසස් කිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බැවින් එදින සිට සංවර්ධන නිලධාරී සේවයේ II ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.**

ආයතන ප්‍රධානියාගේ අත්සන

නම

පදවි නාමය

(නිල මුද්‍රාව තබන්න)

දිනය